ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1996 අංක 21 දරන
## ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනත

---

[සහතිකය සටහන් කළේ 1996 අගෝස්තු මස 21 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

96 අගෝස්තු මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

# 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනත

[සහතිකය සටහන් කළේ 1996 අගෝස්තු මස 21 වන දින]

එල්. ඩී.–ඕ. 12/94.

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, ඒ කොමිෂන් සභාවේ බලතල සහ කර්තව්‍ය නියම කිරීම පිණිස සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, වූ පනතකි.**

1\. මේ පනත 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනත යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

## I වන කොටස

## ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පිහිටුවීම

2\. (1) (මෙහි මින් මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව යයි කියනු ලබන හා හඳුන්වනු ලබන කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පිහිටුවීම.

(2) කොමිෂන් සභාව, අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එහි සංස්ථා නාමයෙන් එය විසින් නඩු පැවරීම ද එයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

(3) කොමිෂන් සභාවේ මුද්‍රාව, කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ භාරයේ තිබිය යුතු අතර, එය කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය.

3\. (1) කොමිෂන් සභාව, මානව හිමිකම්වලට අදාළ කාරණා සම්බන්ධයෙන් දැනුමක් හෝ ප්‍රායෝගික පළපුරුද්දක් ඇත්තා වූ තැනැත්තන් අතුරින් තෝරා ගනු ලබන සාමාජිකයන් පස් දෙනකුගෙන් සමන්විත විය යුතු ය.

කොමිෂන් සභාවේ සංයුතිය සහ ධූර කාලය ආදිය.

CM 034658—5,000 (2021/11)

(2) කොමිෂන් සභාවේ සාමාජිකයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද, නියමිත දිනයෙන් ආරම්භව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිහිටුවනු ලබන දිනයෙන් අවසන් වන කාලසීමාව ඇතුළත, කොමිෂන් සභාවේ සාමාජිකයන්, කථානායකවරයා සහ විපක්ෂයේ නායකවරයා විමසා අග්‍රාමාත්‍යවරයා විසින් කරනු ලබන නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ නිර්දේශ කිරීමේ දී සුළු ජාතීන් කොමිෂන් සභාවේ නියෝජනය වීමේ අවශ්‍යතාව ගැන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සහ අග්‍රාමාත්‍යවරයා විසින් සැලකිල්ල යොමු කළ යුතු ය.

(4) එසේ පත් කරන ලද සාමාජිකයන්ගෙන් එක් සාමාජිකයකු, ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් නම් කරනු ලැබිය යුතු ය.

(5) කොමිෂන් සභාවේ සෑම සාමාජිකයකුම අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය.

(6) සාමාජිකයකුගේ ධුරය —

(අ) ඒ සාමාජිකයා මිය යාමෙන් ;

(ආ) ජනාධිපතිවරයා අමතා යවන ලද ලියවිල්ලක් මගින් ඒ සාමාජිකයා ඒ ධුරයෙන් ඉල්ලා අස්වීමෙන් ;

(ඇ) 4 වන වගන්තියෙහි සඳහන් යම් හේතුවක් මත ඒ සාමාජිකයා ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් ; හෝ

(ඈ) ඔහුගේ ධුර කාලය අවසන් වීමෙන් පසු

හිස් විය යුතු ය.

සාමාජිකයන් ඉවත් කිරීම සඳහා හේතු.

4. (1) කොමිෂන් සභාවේ සාමාජිකයකු,—

(අ) ජනාධිපතිවරයා විසින්,

(i) නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් බුන්වත් තැනැත්තකු බවට විනිශ්චය කරනු ලැබුවහොත් ;

(ii) කථානායකවරයා සහ විපක්ෂයේ නායකවරයා විමසා, අග්‍රාමාත්‍යවරයා විසින් කරනු ලබන නිර්දේශ මත ජනාධිපතිවරයාගේ මතය අනුව කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් වූ තම කාර්ය හා ගැටෙන තම ධුරයේ කාර්යයන්ට බාහිරව යම් ගෙවීම් ලබන සේවා නියුක්තියක නිරත වුවහොත් ;

(iii) මානසික හෝ ශාරීරික දුබලතාවක හේතුවෙන් ධුරයේ දිගටම කටයුතු කිරීමට නුසුදුසු වුවහොත් ;

(iv) නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින්, සිහිවිකල් තැනැත්තකු බවට ප්‍රකාශ කරනු ලැබුව හොත් ;

(v) චරිත දූෂණාත්මක වරදකට වරදකරු කරනු ලැබුව හොත් ; හෝ

(vi) කොමිෂන් සභාවෙන් නිවාඩු ලබා නොගෙන කොමිෂන් සභාවේ අනුක්‍රමික රැස්වීම් තුනකට නොපැමිණිය හොත්,

ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය ; නැතහොත්

(ආ) කොමිෂන් සභාවේ සාමාජිකයකු ඉවත් කිරීම සඳහා, ඔප්පු වී ඇති විෂමාචාරය හෝ අශක්‍යතාව පදනම් කොට ගෙන (නොපැමිණි මන්ත්‍රීවරයන් ඇතුළුව) පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවෙන් බහුතර සංඛ්‍යාවක් විසින් සම්මත කරන ලද පාර්ලිමේන්තු යෝජනාවක් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබීමෙන් පසුව ජනාධිපතිවරයා විසින් කරන ලද නියමයකින් ඒ සාමාජිකයා ධුරයෙන් ඉවත් කළ හැකි ය :

එසේ වුව ද, එවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම සඳහා වූ යෝජනා සම්මතය පිළිබඳව දැන්වීම, පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවෙන් යටත්

පිරිසෙයින් තුනෙන් එකක් විසින් අත්සන් තබා ඇත්නම් හා චෝදිත විෂමාචාරය හෝ අශක්‍යතාව පිළිබඳ සම්පූර්ණ විස්තර එහි දක්වා ඇත්නම් මිස, කථානායකවරයා විසින්, එවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම සඳහා වූ කිසිම යෝජනා සම්මතයක් භාර ගැනීම හෝ පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම හෝ නොකළ යුතු ය.

(2) ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයකු ඉවත් කිරීම සඳහා වූ පාර්ලිමේන්තුවේ යෝජනාවක් ඉදිරිපත් කිරීමේ හා සම්මත කිරීමේ කාර්ය පටිපාටිය, කොමිෂන් සභාවේ සාමාජිකයකු ඉවත් කිරීම සඳහා පාර්ලිමේන්තුවේ යෝජනාවක් ඉදිරිපත් කිරීම හා සම්මත කිරීම සම්බන්ධයෙන්, සියලු ආකාරයෙන් අදාළ විය යුතු ය.

නැවත පත් කිරීම් සඳහා සුදුසුකම්.

5. 4 වන වගන්තිය යටතේ ඉවත් කිරීමක් මගින් හැර සිය ධුරය හිස් කරන යම් සාමාජිකයකු, නැවත පත් කිරීම සඳහා සුදුස්සකු විය යුතු ය.

ඉල්ලා අස්වීම් ආදිය.

6. (1) ජනාධිපතිවරයා අමතා යවන ලද ලිපියක් මගින් සභාපතිවරයා විසින් සභාපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධුර කාලය කොමිෂන් සභාවේ ඔහුගේ සාමාජිකත්වයේ කාලය විය යුතු ය.

(3) රෝගාතුරවීම හෝ වෙනත් අබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා කොමිෂන් සභාවේ සභාපතිවරයාට ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වුවහොත් ඔහු වෙනුවෙන් වැඩ බැලීම සඳහා වෙනත් සාමාජිකයකු ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

පුරප්පාඩුවක් ආදිය තිබීමේ හේතුවෙන් කොමිෂන් සභාවේ ක්‍රියා හෝ කටයුතු අවලංගු වන්නේ යයි සලකනු නොලැබිය යුතු බව.

7. කොමිෂන් සභාවේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් හෝ යම් සාමාජිකයකුගේ පත්වීම පිළිබඳ යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් කොමිෂන් සභාවේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

8. කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ වේතන පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර, ඒ වේතන ඒකාබද්ධ අරමුදලට වැයබරක් කරනු ලැබිය යුතු ය. තව ද ඔවුන්ගේ ධුරකාලය තුළ දී ඒ වේතන අඩු කරනු නොලැබිය යුතු ය.

සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

9. (1) කොමිෂන් සභාවේ සභාපතිවරයා එහි ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අතර, සභාපතිවරයා කොමිෂන් සභාවේ සියලු ම රැස්වීම්වල මූලාසනය දැරිය යුතු ය. යම් රැස්වීමකට ඔහු පැමිණ නොසිටියහොත්, ඒ රැස්වීමට පැමිණ සිටින කොමිෂන් සභාවේ සාමාජිකයන් විසින් ඔවුන් අතුරින් එක් සාමාජිකයකු ඒ රැස්වීමේ මූලාසනය දැරීම පිණිස තෝරා පත්කර ගත යුතු ය.

කොමිෂන් සභාවේ රැස්වීම්.

(2) කොමිෂන් සභාවේ යම් රැස්වීමක සභාපතිවරයාට තමාගේ ඡන්දයට අතිරේකව තීරණ ඡන්දයක් තිබිය යුතු ය.

(3) මේ පනතේ අනෙකුත් විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාව විසින් එහි රැස්වීම් පැවැත්වීම සහ එම රැස්වීම්වල දී කටයුතු කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කර ගනු ලැබිය හැකි ය.

10. කොමිෂන් සභාවේ කර්තව්‍ය පහත සඳහන් පරිදි විය යුතු ය :—

කොමිෂන් සභාවේ කර්තව්‍ය.

(අ) මූලික අයිතිවාසිකම්වලට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධි විධාන අනුව ක්‍රියා කරනු ලබන බවට සහතික කිරීමේ අදහසින් සහ මූලික අයිතිවාසිකම්වලට ගරු කිරීම හා ඒවා පිළිපැදීම ප්‍රවර්ධනය කිරීම පිණිස විධායක හා පරිපාලනමය පිළිවෙත් හා කාර්ය පටිපාටි පිළිබඳව සුපරීක්ෂාවෙන් සිටීම ;

(ආ) මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම හෝ උල්ලංඝනය කිරීමට අත්‍යාසන්නව තිබීම සම්බන්ධයෙන් වූ පැමිණිලි පිළිබඳ විභාග කිරීම හා විමර්ශනය කිරීම සහ මෙහි මින්මතු සලසා ඇති විධිවිධානවලට අනුකූලව සමථයට පත් කිරීමේ හා සමගි කිරීමේ මාර්ගයෙන් ඒවා විසඳීම සඳහා විධිවිධාන සැලැස්වීම ;

(ඇ) මූලික අයිතිවාසිකම් වැඩිදියුණු කිරීමේ, ප්‍රවර්ධනය කිරීමේ හා ආරක්ෂා කිරීමේ නීතිමය සහ පරිපාලනමය විධාන හා කාර්ය පටිපාටි සකස් කිරීමෙහි ලා ආණ්ඩුවට උපදෙස් දීම සහ සහාය වීම ;

(ඈ) ජාතික නීති සහ පරිපාලනමය පිළිවෙත් ජාත්‍යන්තර මානව හිමිකම්වලට, නියමයන්ට හා සම්මතවලට අනුකූල බව සහතික කිරීම පිණිස ගත යුතු පියවර සම්බන්ධයෙන් ආණ්ඩුවට නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(ඉ) මානව හිමිකම් ක්ෂේත්‍රයේ දී ගිවිසුම්වලට සහ වෙනත් ජාත්‍යන්තර සාධන පත්‍රවලට දායකවීමේ හා එකඟවීමේ අවශ්‍යතාව පිළිබඳව ආණ්ඩුවට නිර්දේශ ඉදිරිපත් කිරීම ; සහ

(ඊ) මානව අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් කිරීම ප්‍රවර්ධනය කිරීම හා මානව අයිතිවාසිකම්වලට අනුකූලව අධ්‍යාපනයක් සැලසීම.

කොමිෂන් සභාවේ බලතල.

11. කොමිෂන් සභාවේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා පහත සඳහන් බලතල අතුරින් යම් බලයක් හෝ ඒ බලතල සියල්ලම හෝ කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය :—

(අ) මූලික අයිතිවාසිකම් පිළිබඳ යම් උල්ලංඝනය කිරීමක් හෝ අත්‍යාසන්න උල්ලංඝනය කිරීමක් පිළිබඳව මේ පනතේ පසුව සඳහන් කෙරෙන විධිවිධානවලට අනුකූලව විමර්ශනය කිරීම ;

(ආ) මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් පවරනු ලබන කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යයි කොමිෂන් සභාව විසින් අදහස් කරනු ලබන පළාත් සහා මට්ටමේ උපකමිටු සංඛ්‍යාවක් පත්කිරීම ;

(ඇ) යම් අධිකරණයක් ඉදිරියෙහි විනිශ්චයට භාජනව පවත්නා මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමකට හෝ අත්‍යාසන්න උල්ලංඝනය කිරීමකට හෝ අදාළ වූ යම් නඩු කටයුතුවලට, ඒ අධිකරණයේ අවසරය ඇතිව මැදිහත් වීම ;

(ඈ) අධිකරණමය ආඥාවක් මගින් හෝ අත්‍යාකාරයකින් හෝ රඳවාගෙන සිටින තැනැත්තන්ගේ සුභසිද්ධිය, ඔවුන් රඳවා ගෙන සිටින ස්ථාන නිරතුරුව පරීක්ෂා කිරීමෙන්

සුපරීක්ෂණය කිරීම සහ ඔවුන් රඳවා ගෙන සිටීමේ තත්ත්වයන් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය විය හැකි නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(ඉ) ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන යම් කාරණයක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් ගත යුතු බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි පියවර ගැනීම ;

(ඊ) මානව අයිතිවාසිකම් පිළිබඳව පර්යේෂණ පැවැත්වීම සහ වැඩ සටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පැවැත්වීමෙන් මානව අයිතිවාසිකම් පිළිබඳ දැනුම ප්‍රවර්ධනය කිරීම සහ ඒ පර්යේෂණවල ප්‍රතිඵල ප්‍රචාරණය කිරීම සහ බෙදාදීම ;

(උ) අතෘප්තියට පත් තැනැත්තකු විසින් හෝ අතෘප්තියට පත් තැනැත්තකු වෙනුවෙන් ක්‍රියා කරන තැනැත්තකු විසින් 13 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් කිරීමේ දී ඔහු විසින් සාධාරණව දරන ලද වියදම් පියවීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණයක්, කොමිෂන් සභාවේ පරම අභිමතය පරිදි ප්‍රදානය කිරීම ;

(ඌ) කොමිෂන් සභාවේ කර්තව්‍ය ඉටු කිරීම පිණිස අවශ්‍ය වන්නා වූ හෝ හිතකර වන්නා වූ වෙනත් සියලු දේ කිරීම.

## II වන කොටස

## කොමිෂන් සභාවේ විමර්ශනය කිරීමේ බලතල

12. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කර ඇති ඉල්ලීමක් පිළිබඳව විභාගයක් කරනු ලබන අතරතුර දී මතු වන යම් කාරණයක් විභාග කොට වාර්තා කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබිය හැකි ය. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් යොමු කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන කාරණා සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් , ඒ යොමු කිරීමේ දී නිශ්චිතව සඳහන් කරනු ලැබූ යම් කාලයක් වේ නම්, ඒ කාලය ඇතුළත දී විභාග කොට ශ්‍රේෂ්ඨාධිකරණය වෙත වාර්තා කළ යුතු ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාවේ කාර්ය සඳහා කාලය ගණන් බැලීම.

13\. (1) විධායක හෝ පරිපාලන ක්‍රියාවක් හේතු කොට ගෙන සිදු වී යයි කියනු ලබන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමේ හෝ උල්ලංඝනය කිරීමට අත්‍යාසන්නව තිබීමේ හෝ දින සිට එක් මාසයක් ඇතුළත දී ඒ පිළිබඳ පැමිණිල්ලක් අතෘප්තියට පත් පාර්ශ්වයක් විසින් 14 වන වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාව වෙත කර ඇති අවස්ථාවක දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126(2) වන ව්‍යවස්ථාව ප්‍රකාර ඒ තැනැත්තා විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු කාලය වශයෙන් දක්වා ඇති එක් මාසයක කාල පරිච්ඡේදය ගණන් බැලීමේ දී යට කී පැමිණිල්ල පිළිබඳ පරීක්ෂණය කොමිෂන් සභාව ඉදිරියේ පවත්නා කාල පරිච්ඡේදය ගණන් නොගත යුතු ය.

(2) විභාග කර වාර්තා කිරීම සඳහා 12(1) වන වගන්තිය ප්‍රකාර ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කොමිෂන් සභාව වෙත යොමු කිරීමක් කරනු ලබන අවස්ථාවක දී එකී යොමු කිරීමේ දිනයෙන් ආරම්භව කොමිෂන් සභාවේ වාර්තාවේ දිනය දක්වා වූ කාල පරිච්ඡේදය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 126(5) වන ව්‍යවස්ථාවේ සඳහන් මාස දෙකක කාල පරිච්ඡේදය ගණන් බැලීමේදී ගණන් නොගත යුතු ය.

කොමිෂන් සභාව විසින් එහි මෙහෙයවීමෙන් හෝ පැමිණිල්ලක් මත විමර්ශනය කළ හැකි බව.

14\. කොමිෂන් සභාව විසින් එහි මෙහෙයවීමෙන් හෝ අතෘප්තියට පත් තැනැත්තකු හෝ තැනැත්තන් සමූහයක් විසින් නැතහොත් අතෘප්තියට පත් තැනැත්තකු හෝ තැනැත්තන් සමූහයක් වෙනුවෙන් ක්‍රියා කරන තැනැත්තකු විසින් කොමිෂන් සභාව වෙත කරන ලද පැමිණිල්ලක් මත–

(අ) විධායක හෝ පරිපාලන ක්‍රියාවක් මගින් ; හෝ

(ආ) 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ යම් තැනැත්තකු විසින් සිදු කරන ලද වරදක් සංස්ථාපනය කරන ක්‍රියාවක ප්‍රතිඵලයක් වශයෙන්

අතෘප්තියට පත් එම තැනැත්තාගේ හෝ එම තැනැත්තන් සමූහයේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් හෝ අත්‍යාසන්න උල්ලංඝනය කිරීමක් පිළිබඳව චෝදනාවක් කොමිෂන් සභාව විසින් විමර්ශනය කළ හැකි ය.

15. (1) 14 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් පවත්වන ලද විමර්ශනයක දී විධායක හෝ පරිපාලන ක්‍රියාවක් මගින් හෝ 14 වන වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් හෝ සිදු කරන ලද මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය කිරීමක් හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීමක් හෙළිදරව් නොවන අවස්ථාවක, කොමිෂන් සභාව විසින් තත් කාරණය වාර්තාගත කොට, ඒ අනුව දින තිහක් ඇතුළත පැමිණිල්ල කළ තැනැත්තා වෙත දැනුම් දිය යුතු ය.

උල්ලංඝනයවීම හෙළිදරව් නොවූ හෝ හෙළිදරව් වූ අවස්ථාවක කාර්ය පටිපාටිය.

(2) 14 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් පවත්වන ලද විමර්ශනයක දී විධායක හෝ පරිපාලන ක්‍රියාවක් මගින් හෝ 14 වන වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් හෝ සිදු කරන ලද මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය කිරීමක් හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීමක් හෙළිදරව් වූ අවස්ථාවක, උචිත පරිදි, ඒ කාරණය සමගි කිරීම හෝ සමථයට පත් කිරීම සඳහා යොමු කිරීමට කොමිෂන් සභාවට බලය ඇත්තේ ය.

(3) 14 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් පවත්වන ලද විමර්ශනයක දී විධායක හෝ පරිපාලන ක්‍රියාවක් මගින් හෝ 14 වන වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් හෝ සිදු කරන ලද මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය කිරීමක් හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීමක් හෙළිදරව් වූ අවස්ථාවක, කොමිෂන් සභාව විසින් ඒ කාරණය, සමගි කිරීම හෝ සමථයට පත් කිරීම සඳහා යොමු කිරීම උචිත නොවන බව කොමිෂන් සභාවට පෙනී යන අවස්ථාවක, නැතහොත් ඒ කාරණය සමගි කිරීමට හෝ සමථයට පත් කිරීමට උචිත බව කොමිෂන් සභාවට පෙනී යන නමුත්, පාර්ශ්වකරුවන් සියල්ලම හෝ පාර්ශ්වකරුවන් අතුරින් යම් පාර්ශ්වකරුවකු විසින් සමගි කිරීමට හෝ සමථයට පත් කිරීමට විරුද්ධ වන අවස්ථාවක, නැතහොත් සමගි කරවීමට හෝ සමථයට පත් කිරීමට ගත් උත්සාහය අසාර්ථක වූ අවස්ථාවක–

(අ) ඒ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරන තැනැත්තාට හෝ තැනැත්තන්ට විරුද්ධව නඩු පවරන ලෙස හෝ වෙනත් නඩු කටයුතු පවරන ලෙස උචිත බලධරයන්ට නිර්දේශ කරනු ලැබිය හැකි ය ;

(ආ) ඒ කාරණය විභාග කර නිශ්චය කිරීම සඳහා නියම කරනු ලැබ ඇති අධිකරණයේ රීතිවලට අනුව සහ යම් තැනැත්තකු විසින් ඒ අධිකරණයේ අධිකරණ බලය ක්‍රියාත්මක කරවා ගැනීම පිණිස විධිවිධාන සලසා ඇති යම් කාලයක් ඇතුළත විභාග කර නිශ්චය කිරීම සඳහා අධිකරණ බලය ඇති යම් අධිකරණයක් වෙත යොමු කරනු ලැබිය හැකි ය ;

(ඇ) ඒ උල්ලංඝනය කිරීම හෝ ඒ උල්ලංඝනය දිගට ම පැවතීම වැළැක්වීමේ හෝ ඊට ප්‍රතිකර්ම යෙදීමේ අදහසින්, උචිත බලධරයා වෙත හෝ අදාළ තැනැත්තා හෝ තැනැත්තන් වෙත කොමිෂන් සභාව සුදුසු යයි කල්පනා කරන යම් නිර්දේශ කරනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ කරනු ලැබිය හැකි නිර්දේශවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, කොමිෂන් සභාව විසින්--

(අ) මූලික අයිතිවාසිකමක් උල්ලංඝනයවීම හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීම උද්ගත වන ක්‍රියාව හෝ නොකර හැරීම, නැවත සලකා බලන ලෙස හෝ නිවැරදි කරන ලෙස, නිර්දේශ කරනු ලැබිය හැකි ය ;

(ආ) මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය වීම හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීම උද්ගත වන තීරණය, නැවත සලකා බලන ලෙස හෝ නිවැරදි කරන ලෙස, නිර්දේශ කරනු ලැබිය හැකි ය ;

(ඇ) මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය වීම හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීම උද්ගත වන්නා වූ තීරණය, නිර්දේශය, ක්‍රියාව හෝ නොකර හැරීම පදනම් වූයේ යම් පිළිවෙතක් මත ද, ඒ පිළිවෙත වෙනස් කරන ලෙස, නිර්දේශ කරනු ලැබිය හැකි ය ; තව ද

(ඈ) මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය වීම හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීම උද්ගත වන්නා වූ තීරණය, නිර්දේශය, ක්‍රියාව හෝ නොකර හැරීම සඳහා හේතු දැක්විය යුතු බවට, නිර්දේශ කරනු ලැබිය හැකි ය.

(5) ඒ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරනු ලැබීමට ආසන්නව සිටින බවට හෝ උල්ලංඝනය කර ඇති බවට හෝ චෝදිත තැනැත්තාට කරුණු කියා සිටීමට අවස්ථාවක් සලසා දීමෙන් පසුව හැර, මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය කිරීම හෝ අත්‍යාසන්න උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන්, කොමිෂන් සභාව විසින් මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ නිර්දේශයක් කරනු නොලැබිය යුතු ය.

(6) මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය කිරීම හෝ අත්‍යාසන්න උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ කරනු ලැබූ නිර්දේශයක පිටපතක්, කොමිෂන් සභාව විසින්, අතෘප්තියට පත් තැනැත්තාට, අදාළ ආයතනයේ ප්‍රධානයාට සහ අදාළ ආයතනය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාට යවනු ලැබිය යුතු ය.

(7) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ නිර්දේශයක් යවනු ලැබූ යම් අධිකාරියකට හෝ තැනැත්තකුට හෝ තැනැත්තන්ට, ඒ නිර්දේශයේ සඳහන් කරනු ලැබිය හැකි යම් කාලයක් ඇතුළත, ඒ නිර්දේශය බලාත්මක කිරීම පිණිස ඒ තැනැත්තා විසින් ගන්නා ලද හෝ ගැනීමට අදහස් කරන ක්‍රියා මාර්ගය සම්බන්ධයෙන් කොමිෂන් සභාවට වාර්තා කරන ලෙස නියම කරනු ලැබිය යුතු අතර, ඒ අනුව කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම ඒ සෑම තැනැත්තකුගේ ම යුතුකම විය යුතු ය.

(8) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ නිර්දේශයක් යවනු ලැබූ යම් අධිකාරියක් හෝ තැනැත්තකු හෝ තැනැත්තන් විසින්, ඒ නිර්දේශයේ සඳහන් කාලය ඇතුළත, කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක හෝ ඒ තැනැත්තා විසින් කොමිෂන් සභාව වෙත වාර්තා කර, කොමිෂන් සභාවේ නිර්දේශ බලාත්මක කිරීම පිණිස ඔහු විසින් ගෙන ඇති හෝ ගැනීමට අදහස් කර ඇති ක්‍රියා මාර්ගය, කොමිෂන් සභාවේ මතය අනුව ප්‍රමාණවත් නොවන අවස්ථාවක, කොමිෂන් සභාව විසින් ඒ කරුණ පිළිබඳ පරිපූර්ණ වාර්තාවක් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ජනාධිපතිවරයා විසින් ඒ වාර්තාවේ පිටපතක් පාර්ලිමේන්තුව ඉදිරියෙහි තැබීමට සැලැස්විය යුතු ය.

සමගි කිරීමේ හෝ සමථයට පත් කිරීමේ කාර්ය පරිපාටිය.

16. (1) 15 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් කාරණයක් සමගි කිරීම හෝ සමථයට පත් කිරීම සඳහා යොමු කරනු ලැබූ අවස්ථාවක, පාර්ශ්වකරුවන් අතර සමගි කිරීම හෝ සමථයට පත් කිරීම පිණිස එක් තැනැත්තකු හෝ තැනැත්තන් වැඩි ගණනක් කොමිෂන් සභාව විසින් පත් කළ යුතු ය.

(2) සමගිකරුවන් හෝ සමථකරුවන් පත් කිරීමේ ආකාරය සහ ඔවුන්ගේ බලතල හා කර්තව්‍ය නියමිත පරිදි විය යුතු ය.

(3) සමගි කිරීමේ හෝ සමථයට පත් කිරීමේ කාර්යය සඳහා සමගි කරුවන් හෝ සමථකරුවන් ඉදිරියෙහි පෙනී සිටින ලෙස කොමිෂන් සභාව විසින් පාර්ශවකරුවන්ට විධාන කරනු ලැබිය හැකි ය. සමගි කිරීම හෝ සමථයකට පත් කිරීම පිළිබඳව පවත්වනු ලබන සියලු රැස්වීම් රහසිගතව පැවැත්විය හැකි ය.

(4) සමගි කිරීම හෝ සමථයට පත් කිරීම සාර්ථක නොවූ විටක හෝ එක් පාර්ශවකරුවකු සමගි කිරීමට හෝ සමථයට පත් කිරීමට විරුද්ධ වූ අවස්ථාවක, සමගිකරුවා හෝ සමථකරුවා විසින් ඒ අනුව කොමිෂන් සභාව වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

(5) සමගි කිරීමෙන් හෝ සමථයට පත් කිරීමෙන් කාරණය විසඳීම සමගිකරුවන්ට හෝ සමථකරුට සාර්ථකව කළ හැකි වූ අවස්ථාවක, එළඹුණු නිරවුල් කිරීම පිළිබඳව ඔවුන් විසින් කොමිෂන් සභාව වෙත දැනුම් දිය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ කාරණයක් සමගි කිරීම හෝ සමථයට පත් කිරීම සඳහා යොමු කරනු ලැබ, නිරවුල් කිරීමකට එළඹී අවස්ථාවක, ඒ නිරවුල් කිරීම බලාත්මක කිරීම පිණිස අවශ්‍ය විය හැකි (වන්දි ගෙවීම පිණිස වූ විධාන ඇතුළුව) විධාන කොමිෂන් සභාව විසින් කරනු ලැබිය යුතු ය.

*ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කිරීම.*

17. කොමිෂන් සභාව විසින් පවත්වා ගෙන යනු ලබන විභාගයක දී හෝ විමර්ශනයක දී මූලික අයිතිවාසිකමක විෂය පථය හෝ කාර්ය පථය පිළිබඳ ප්‍රශ්නයක් උද්ගත වූ අවස්ථාවක, ඒ ප්‍රශ්නය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 125 වන ව්‍යවස්ථාව අනුව කොමිෂන් සභාව විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කරනු ලැබිය හැකි ය.

*විභාගවලට අදාළ බලතල.*

18. මේ පනත යටතේ වූ විභාගයක් හෝ විමර්ශනයක් කිරීමේ කාර්ය සඳහා කොමිෂන් සභාවට පහත සඳහන් බලතල තිබිය යුතු ය :-

(අ) ලබා ගැනීමට අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි කොමිෂන් සභාව කල්පනා කරන ලිඛිත හෝ වාචික සියලු සාක්ෂි ලබා ගැනීම හා භාර ගැනීම සහ ප්‍රශ්න කරනු ලැබීමට

අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි කොමිෂන් සභාව කල්පනා කරන සියලු තැනැත්තන්ගෙන් සාක්ෂිකරුවන් වශයෙන් ප්‍රශ්න කිරීම ;

(ආ) දිවුරුම පිට හෝ ප්‍රතිඥාව පිට යම් සාක්ෂිකරුවකුට (ලිඛිත හෝ වාචික) සාක්ෂි දෙන ලෙස නියම කිරීම, ඒ දිවුරුම හෝ ප්‍රතිඥාව, ඒ සාක්ෂිකරු අධිකරණයක සාක්ෂි දෙන්නේ නම් ඔහු විසින් දිය යුතු බවට නියම කරනු ලැබිය හැකි දිවුරුම හෝ ප්‍රතිඥා දීම විය යුතු ය ; තව ද ඒ සෑම සාක්ෂිකරුවකු ම ලවා දිවුරුමක් හෝ ප්‍රතිඥාදීමක් කරවීම හෝ තත් කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් බලය දී ඇති නිලධරයකු මගින් කරවීමට සැලැස්වීම ;

(ඇ) ශ්‍රී ලංකාව තුළ පදිංචිව සිටින යම් තැනැත්තකු සාක්ෂි දීම පිණිස හෝ තම සන්තකයෙහි ඇති යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කිරීම පිණිස කොමිෂන් සභාවේ යම් රැස්වීමකට පැමිණෙන ලෙස කැඳවීම සහ සාක්ෂිකරුවකු ලෙස ඔහුගෙන් විභාග කිරීම හෝ ඔහු සන්තකයේ ඇති යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කරන ලෙස ඔහුට නියම කිරීම ;

(ඈ) සාක්ෂි ආඥාපනතේ විධිවිධාන කියිවක් නොතකා සිවිල් හෝ අපරාධ නඩු කටයුතුවල දී ආවේශ්‍ය නොවිය හැකි ලිඛිත හෝ වාචික හෝ යම් සාක්ෂියක් ආවේශ්‍ය කිරීම ;

(ඉ) එවැනි විභාගයකට හෝ විමර්ශනයකට හෝ එහි යම් කොටසකට මහජනයාට ඇතුළුවීමට ඉඩදීම හෝ එයේ ඉඩ නොදීම.

19. (1) කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙන තැනැත්තකු ට ඒ සාක්ෂි සම්බන්ධයෙන්, අධිකරණයක් ඉදිරියේ සාක්ෂි දෙන සාක්ෂිකරුවකු ඒ අධිකරණය ඉදිරියේ දෙන සාක්ෂි සම්බන්ධයෙන් ඔහු නීතියෙහි ලා හිමිකම් ලබන සියලු වරප්‍රසාදවලට, හිමිකම් තිබිය යුතු ය.

කොමිෂන් සභාව ඉදිරියෙහි දෙනු ලබන සාක්ෂි.

(2) කොමිෂන් සභාවට හෝ කොමිෂන් සභාව ඉදිරියේ දෙන ලද ලිඛිත වූ හෝ වාචික වූ හෝ යම් සාක්ෂියක් සම්බන්ධයෙන් කිසිම තැනැත්තකු, යම් අධිකරණයක දී යම් නඩුවකට, නඩු පැවරීමකට හෝ සිවිල් වූ හෝ අපරාධ වූ හෝ වෙනත් නඩු කටයුත්තකට යටත් නොවිය යුතු ය.

(3) මෙහි මින් මතු සලකා ඇති විධිවිධානවලට යටත්ව, යම් තැනැත්තකු විසින් කොමිෂන් සභාවට හෝ කොමිෂන් සභාව ඉදිරියේ කරන ලද හෝ දෙන ලද යම් ප්‍රකාශයක් පිළිබඳ කිසිම සාක්ෂියක්, යම් අධිකරණයක යම් නඩුවක දී, නඩු පැවරීමක දී හෝ සිවිල් වූ හෝ අපරාධ වූ හෝ වෙනත් නඩු කටයුත්තක දී ඒ තැනැත්තාට විරුද්ධව ආවේශ්‍ය කරගනු නොලැබිය යුතු ය :

එසේ වුව ද මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධානවලට ඇතුළත් කිසිවකින්—

(අ) මේ පනතේ 23 වන වගන්තිය සමග කියවිය යුතු දණ්ඩ නීති සංග්‍රහයේ XI වන පරිච්ඡේදය යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් වූ යම් නඩු පැවරීමකට හෝ දණ්ඩනයකට බලපෑමක් සිදු නොවිය යුතු ය ; නැතහොත් ඒ කෙරෙහි බලපාන්නේ යයි සලකනු නොලැබිය යුතු ය ; නැත්හොත් එසේ වන්නේ යයි තේරුම් ගනු නොලැබිය යුතු ය ;

(ආ) කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙන යම් සාක්ෂිකරුවකු ට විරුද්ධව දණ්ඩ නීති සංග්‍රහයේ XI වන පරිච්ඡේදය යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් නඩු පැවරීමේ කාර්ය සඳහා, ඒ සාක්ෂිකරුගේ නම ප්‍රසිද්ධ කිරීම හෝ හෙළිදරව් කිරීම නැතහොත් ඒ සාක්ෂිකරුගේ සාක්ෂිය හෝ එහි යම් කොටසක් හෙළිදරව් කිරීම තහනම් කරනු නොලැබිය යුතු ය ; නැතහොත් තහනම් වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය ; නැතහොත් එසේ වන්නේ යයි තේරුම් ගනු නොලැබිය යුතු ය.

සිතාසි භාර දීම.

20. (1) සෑම සිතාසියක් ම කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ අත්සන යටතේ විය යුතු ය.

(2) යම් සිතාසියක් එහි නම්කළ තැනැත්තා වෙත ගෙන ගොස් භාරදීමෙන් භාරදෙනු ලැබිය හැකි අතර, එසේ කිරීම ප්‍රායෝගික නොවන අවස්ථාවක දී, ඒ සිතාසිය ඒ තැනැත්තාගේ අවසන් වරට දැන සිටි පදිංචි ස්ථානයෙහි තැබීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් යැවීමෙන් භාර දෙනු ලැබිය හැකි ය.

(3) සිතාසියක් භාර දෙනු ලැබූ සෑම තැනැත්තකු ම, ඒ සිතාසියෙහි සඳහන් කර ඇති වේලාවේ දී හා ස්ථානයේ දී කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටිය යුතු අතර, කොමිෂන් සභාව විසින් ඔහුගෙන් අසනු ලබන ප්‍රශ්නවලට උත්තරදීම හෝ ඉදිරිපත් කරන ලෙස සිතාසියෙහි භාවය අනුව ඔහුට නියම කර ඇති සහ ඔහුගේ සන්තකයේ හෝ බලයෙහි ඇති ලේඛන හෝ වෙනත් දේ ඉදිරිපත් කිරීම, කළ යුතු ය.

21. (1) කොමිෂන් සභාවේ අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි සිදු කරන ලද සෑම අපහාස වරදක් සම්බන්ධයෙන් ඒ වරද ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි සිදු කරන ලද අපහාස වරදක් වූවාක් මෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දඬුවම් කරනු ලැබිය යුතු අතර, ඒ සෑම වරදක් ම විභාග කිරීමේ අධිකරණ බලය මෙයින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පැවරෙන්නේ ය. අපහාසය සම්බන්ධයෙන් දඬුවම්.

(2) කොමිෂන් සභාව සම්බන්ධයෙන්, කොමිෂන් සභාව ඉදිරිපිට දී හෝ අන්‍යාකාරයකින් හෝ කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක්, ඒ කරන ලද හෝ නොකර හරින ලද ක්‍රියාව ශ්‍රේෂ්ඨාධිකරණය සම්බන්ධයෙන් කරන ලද නම් හෝ නොකර හරින ලද නම්, ඉන් ඒ අධිකරණයේ අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි අපහාස වරදක් සංයුක්ත වන්නේ නම්, කරන ලද හෝ නොකර හරින ලද ඒ ක්‍රියාවෙන් කොමිෂන් සභාවේ අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි අපහාස වරදක් සංයුක්ත වන්නේ ය.

(3) යම් තැනැත්තකු විසින්-

(අ) මේ පනත යටතේ භාර දෙන ලද සිතාසියක සඳහන් වේලාවේ දී හා ස්ථානයේ දී කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීම, කොමිෂන් සභාවේ මතය අනුව සාධාරණ වන හේතුවක් නොමැතිව පැහැර හරිනු ලැබුවහොත් ; හෝ

(ආ) දිවුරුම් හෝ ප්‍රතිඥාදීම, ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ යථා පරිදි දිවුරා හෝ ප්‍රතිඥා දෙනු ලැබ, කොමිෂන් සභාව විසින් විභාග කෙරෙමින් හෝ විමර්ශණය කෙරෙමින් තිබෙන කරුණු සම්බන්ධව තමා වෙත ඉදිරිපත් කරනු ලැබූ යම් ප්‍රශ්ණයකට පිළිතුරු දීම

කොමිෂන් සභාවේ මතය අනුව සාධාරණ වන හේතුවක් නොමැතිව, ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ පැහැර හරිනු ලැබුවහොත් ; හෝ

(ඈ) කොමිෂන් සභාව විසින් තමා වෙත නිකුත් කරන ලද දැන්වීමක හෝ කරන ලද ලිඛිත ආඥාවක හෝ විධානයක නියමයන් අනුව ක්‍රියා කිරීම, කොමිෂන් සභාවේ මතය අනුව සාධාරණ වන හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ පැහැර හරිනු ලැබුවහොත් ; හෝ

(ඇ) මේ පනත යටතේ සිතාසියක් භාර දෙනු ලැබ, කොමිෂන් සභාවේ මතය අනුව, විමර්ශනය කළ යුතු කාරණාවල සත්‍යතාව නිගමනය කිරීම සඳහා අවශ්‍ය වූ දාතම සන්තකය හෝ බලය යටතේ ඇත්තා වූ ද, යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් කොමිෂන් සභාවේ මතය අනුව සාධාරණ වන හේතුවක් නොමැතිව සභාවට ඉදිරිපත් කිරීම සහ පෙන්වීම, ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ පැහැර හරිනු ලැබුවහොත්

ඒ තැනැත්තා කොමිෂන් සභාවේ අධිකාරයට විරුද්ධව , හෝ ඊට අගෞරව වන පරිදි අපහාස කිරීමේ වරදට වරදකරු වන්නේ ය.

(4) යම් තැනැත්තකු විසින්, කොමිෂන් සභාවේ අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි (2) වන උපවගන්තිය හෝ (3) වන උපවගන්තිය යටතේ යම් අපහාස වරදක් සිදුකර ඇති බවට කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබූ අවස්ථාවක, කොමිෂන් සභාව විසින් ඒ නිශ්චය කිරීම දැක්වෙන සහතිකයක් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යැවිය හැකි ය : ඒ සෑම සහතිකයක් ම කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් අත්සන් කරනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි, සැලකිල්ලට ගැනීම සුදුසු යයි ශ්‍රේෂ්ඨාධිකරණය කල්පනා කරන අපහාස වරදක් සම්බන්ධයෙන් දඬුවම් කිරීම සඳහා වූ යම් නඩු කටයුත්තක දී (4) වන උපවගන්තිය යටතේ අත්සන් කරන ලද සහ අධිකරණය වෙත යවන ලද සහතිකයක් යයි කියනු ලබන යම් ලේඛනයක් -

(අ) සාක්ෂි වශයෙන් පිළිගනු ලැබිය යුතු අතර, පටහැනිව කරුණු ඔප්පු කරනු ලැබුවහොත් මිස, වැඩිදුර ඔප්පු කිරීමක් නොමැතිව එය එසේ වූ සහතිකයක් ලෙස සලකනු ලැබිය යුතු ය ; තව ද

(ආ) සහතිකයේ දැක්වෙන නිශ්චය කිරීම කොමිෂන් සභාව විසින් කරන ලද බවට සහ නිශ්චය කිරීමේ සඳහන් කරුණු සම්බන්ධයෙන් සාක්ෂි විය යුතු ය.

(6) කොමිෂන් සභාවේ අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි වූ වරදක් යයි කියනු ලබන යම් අපහාස වරදක් සම්බන්ධයෙන් දඬුවම් කිරීම පිණිස මේ වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි පවත්වනු ලබන යම් නඩු කටයුතුවල දී කොමිෂන් සභාවේ කිසිම සාමාජිකයකු, මේ පනතේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ඔහුගේ කැමත්ත ඇතිව හැර, සාක්ෂිකරුවකු වශයෙන් කැඳවීම හෝ ඔහුගෙන් ප්‍රශ්න කිරීම හෝ කරනු නොලැබිය යුතු ය.

## III වන කොටස

## කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය

**22.** (1) කොමිෂන් සභාවට ලේකම්වරයකු පත් කරනු ලැබිය යුතු ය. — කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පත් කිරීම.

(2) මේ පනත යටතේ කොමිෂන් සභාව වෙත පැවරි ඇති කර්තව්‍ය ඉටුකිරීමෙහි ලා කොමිෂන් සභාවට සහාය වීම පිණිස අවශ්‍ය විය හැකි වෙනත් යම් නිලධරයන් හා සේවකයන් පත් කරනු ලැබිය හැකි ය.

**23.** කොමිෂන් සභාවේ සාමාජිකයන් සහ කොමිෂන් සභාවට සහාය වීම පිණිස පත් කරන ලද නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ පනත යටතේ පවත්වනු ලබන සෑම විමර්ශනයක් ම ඒ නීති සංග්‍රහයේ අර්ථානුකූලව අධිකරණ නඩු කටයුත්තක් ලෙස සලකනු ලැබිය යුතු ය. — කොමිෂන් සභාවේ සාමාජිකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**24.** කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාවේ බලතල අතුරින් කවර හෝ බලයක් කොමිෂන් සභාවට සහාය වීම පිණිස පත් කරන ලද යම් නිලධරයකුට පවරනු ලැබිය හැකි — බලතල පැවරීම.

අතර, ඒ බලතල එසේ පවරන ලද තැනැත්තා විසින් ඒ බලතල කොමිෂන් සභාවේ විධානයට යටත්ව ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම.

25. (1) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු කොමිෂන් සභාවේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව, කොමිෂන් සභාව විසින් එවැනිම කැමැත්ත ඇතිව, නිශ්චය කරනු ලබන කාලසීමාවක් සඳහා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) නිශ්චිත කාලසීමාවක් ආණ්ඩුවට සේවය කිරීමට ගිවිසගෙන ඇති තැනැත්තකු කොමිෂන් සභාව විසින් සේවයෙහි යොදවා ගනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් කොමිෂන් සභාවට සේවය කරනු ලබන යම් කාලසීමාවක් ඒ ගිවිසුම් යටතේ ඒ තැනැත්තාගේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

නඩු පැවරීමෙන් ආරක්ෂාව.

26. (1) කොමිෂන් සභාවේ සාමාජිකයකු හෝ කොමිෂන් සභාවට සහායවීම පිණිස පත් කරන ලද යම් නිලධරයකු හෝ සේවකයකු විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලද බවට උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට, නිලධරයාට හෝ සේවකයාට විරුද්ධව හෝ අපහාස

කිරීමේ වරද සම්බන්ධයෙන් හැර කොමිෂන් සභාවට වෙනත් යම් ආකාරයකින් සහාය වන වෙනත් යම් තැනැත්තකුට විරුද්ධව හෝ කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) අපහාස වරදක් සම්බන්ධයෙන් හෝ මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වන නඩු කටයුත්තක කාර්ය සඳහා අවශ්‍ය පරිදි හැර, කොමිෂන් සභාව විසින් මේ පනත යටතේ පවත්වනු ලබන යම් විභාගයකදී හෝ විමර්ශනයකදී කොමිෂන් සභාවට ලැබෙන යම් ලියවිල්ලක් යම් අධිකරණයක් වෙත ඉදිරිපත් කරන ලෙස හෝ දැන ගන්නට ලැබෙන යම් කාරණයක් හෝ දෙයක් යම් අධිකරණයක් වෙත හෙළිදරව් කරන ලෙස කොමිෂන් සභාවේ සාමාජිකයකුට හෝ කොමිෂන් සභාවට සහාය වීම පිණිස පත් කරන ලද යම් නිලධරයකුට හෝ සේවකයකුට නියම කරනු නොලැබිය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින් මේ පනත යටතේ සපයන යම් වාර්තාවක් සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ යම් සාමාජිකයකුට විරුද්ධව හෝ ඒ වාර්තාව පිළිබඳ සාරානුකූලව සත්‍ය විස්තරයක් වෙනත් යම් තැනැත්තකු විසින් පළ කිරීම සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව හෝ යම් අධිකරණයක දී කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(4) කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාවට විරුද්ධව හෝ යම් අධිකරණයක් ඉදිරියට පමුණුවනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී කොමිෂන් සභාව විසින් දරන ලද යම් වියදමක් කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී කොමිෂන් සභාව වෙත ගෙවූ හෝ කොමිෂන් සභාව විසින් අයකර ගන්නා ලද හෝ ගාස්තු කිසිවක් කොමිෂන් සභාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(5) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු විසින් හෝ එහි යම් නිලධරයකු හෝ සේවකයකු විසින් නැතහොත් කොමිෂන් සභාවට සහාය වීම පිණිස පත් කරන ලද යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ කොමිෂන් සභාවේ විධානය මත හෝ කරන ලද නැතහොත් කරන ලදැයි අදහස් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව යම් අධිකරණයක පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරන ලද

වියදම් ඒ සිවිල් නඩුවේ දී හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අය කරගෙන ඇත්නම් මිස, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරනු ලැබුවේ යයි අධිකරණය තීරණය කරන්නේ නම්, ඒ තැනැත්තාට කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාව අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

27. කොමිෂන් සභාව අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

## IV වන කොටස

### සාමාන්‍ය

සිරභාරයට ගැනීම ආදිය පිළිබඳව කොමිෂන් සභාවට දැනුම් දීමට ඇති යුතුකම් සහ තොරතුරු ලබාගැනීම පිණිස පරීක්ෂා කිරීමට කොමිෂන් සභාවට ඇති බලය.

28. (1) 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ හෝ (40 වන අධිකාරය වන) මහජන ආරක්ෂක ආඥාපනත යටතේ සාදන ලද නියෝගයක් යටතේ තැනැත්තකු සිරභාරයට ගන්නා ලද හෝ රඳවා ගන්නා ලද අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ සිරභාරයට ගැනීම හෝ රඳවා ගැනීම පිළිබඳව ද එසේ සිරභාරයට ගන්නා ලද හෝ රඳවා ගන්නා ලද තැනැත්තා අත් අඩංගුවේ තබා ගෙන, හෝ රඳවා ගෙන ඇති ස්ථානය පිළිබඳව ද කොමිෂන් සභාව වෙත වහාම දැනුම්දීමත් එසේ දැනුම්දීමේ දී, කවර අවස්ථාවක වුව, ඒ සිරභාරයට ගැනීම හෝ රඳවා තබා ගැනීම හෝ කරනු ලැබූ වේලාවේ සිට පැය හතළිස් අටක් නොඉක්මවන කාලයක් තුළ දී ඒ සිරභාරයට ගැනීම පිළිබඳව කොමිෂන් සභාව වෙත දැනුම් දීමක් අවස්ථාවෝචිත පරිදි, ඒ සිරභාරයට ගැනීම කරන හෝ රඳවා ගැනීමේ ආඥාව කරන, තැනැත්තාගේ කාර්යය විය යුතු ය. එසේ අත්අඩංගුවේ තබා ගෙන හෝ රඳවා ගෙන ඇති තැනැත්තකු මුදා හරිනු ලැබීම හෝ වෙනත් රැඳවුම් ස්ථානයකට මාරු කරනු ලැබූ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ මුදාහැරීම හෝ මාරු කිරීම පිළිබඳව ද, මාරු කිරීමක් සම්බන්ධයෙන් වන විට අලුත් රැඳවුම් ස්ථානයේ පිහිටීම පිළිබඳව ද කොමිෂන් සභාව වෙත දැනුම් දීම, අවස්ථාවෝචිත පරිදි, ඒ මුදාහැරීම හෝ මාරු කිරීම සඳහා ආඥාව කරන තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින් ලියවිල්ලකින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින්, කවර හෝ වේලාවක දී, යම් තැනැත්තකු අධිකරණමය ආඥාවක් මගින් හෝ අන්‍යාකාරයකින් රඳවා සිටින යම් රැඳවුම් ස්ථානයකට, පොලිස් ස්ථානයකට, බන්ධනාගාරයකට හෝ වෙනත් යම් ස්ථානයකට ඇතුල් වී, එහි රඳවා සිටින තැනැත්තන්ගේ රඳවාගෙන සිටීමේ කොන්දේසි නිසැකව දැන ගැනීම පිණිස අවශ්‍යවන්නා වූ යම් පරීක්ෂා ඒ ස්ථානයෙහි කළ හැකි ය : නැතහොත් එහි සිටින යම් තැනැත්තකුගෙන් යම් විමසීම් කළ හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ බලය දෙනු ලැබූ නිලධරයකු විසින්, ඒ උපවගන්තියෙන් ඔහු වෙත පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී, (1) වන උපවගන්තිය යටතේ යුතුකමක් පනවනු ලැබ ඇත්තා වූ සහ (1) වන උපවගන්තියෙන් නියම කොට ඇති පරිදි කොමිෂන් සභාව වෙත දැනුම්දීම ඕනෑකමින් ම නොකර හරින්නා වූ හෝ ඒ නිලධරයාට ප්‍රතිරෝධය දක්වන්නා වූ හෝ බාධා කරන්නා වූ යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

29. (1) මේ පනතින් කොමිෂන් සභාව වෙත පැවරී ඇති කර්තව්‍ය ඉටු කිරීමට කොමිෂන් සභාවට හැකිවනු පිණිස, රජය විසින් කොමිෂන් සභාව වෙත ප්‍රමාණවත් අරමුදල් ලබා දිය යුතු ය. කොමිෂන් සභාවේ අරමුදල්.

(2) කොමිෂන් සභාව විසින් එහි ආදායම සහ වියදම පිළිබඳව සහ වත්කම් හා බැරකම් පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට සැලැස්විය යුතු ය.

(3) කොමිෂන් සභාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, කොමිෂන් සභාවේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

කොමිෂන් සභාව විසින් වාර්තා කළ යුතු බව.

30. කොමිෂන් සභාව විසින්, වාර්ෂික වාර්තාවක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු අතර, වාර්තාව අදාළ වන වර්ෂයේ කොමිෂන් සභාවේ සියලු කටයුතු පිළිබඳව ඒ වාර්තාවේ ඇතුළත් කළ යුතු ය ; තව ද කොමිෂන් සභාව වෙත යොමු කරන ලද සියලු කාරණාවල ලැයිස්තුවක් ද, ඒ කාරණා සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ගය ද, ඒ එක් එක් කාරණය සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ නිර්දේශද ඒ වාර්තාවේ ඇතුළත් විය යුතු ය. අවශ්‍ය යයි කොමිෂන් සභාව විසින් අදහස් කරනු ලබන කවර හෝ අවස්ථාවක, කොමිෂන් සභාවට යොමු කරන ලද යම් නිශ්චිත කාරණයක් හෝ කාරණා ද ඒ සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියා මාර්ග ද පිළිබඳව වාරික වාර්තා හෝ විශේෂ වාර්තා ඉදිරිපත්කළ හැකි ය.

නියෝග.

31. (1) මේ පනතේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ සහ විධිවිධාන බලගැන්වීමේ කාර්යය සඳහා හෝ නියමිත යයි මේ පනතින් නියම කරන ලද හෝ නියෝග සෑදීමට මේ පනතින් බලය දී ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් හෝ අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් පැවරුණු බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව අමාත්‍යවරයා විසින්, මේ පනත යටතේ විමර්ශන පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය නියම කෙරෙන නියෝග සාදනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එය එසේ පළ කරනු ලැබූ දිනයෙහි හෝ නියෝගයේ සඳහන් යම් පසු දිනයක හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු, හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එහි අනනුමතයේ දින සිට, එහෙත්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

32. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

33. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි -

අර්ථ නිරූපනය.

"මූලික අයිතිවාසිකම" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ප්‍රකාශකොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකමක් අදහස් වේ ;

"ආයතනයේ ප්‍රධානයා" යන්නෙන් -

(අ) එය ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක සේවය කරන රජයේ නිලධරයකු සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා නැතහොත් ඒ රජයේ නිලධරයා ඒ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා වන අවස්ථාවක, ඒ දෙපාර්තමේන්තුව වෙන් කර දී ඇති අමාත්‍යාංශයේ ලේකම්වරයා ඉන් අදහස් වේ ;

(ආ) එය අමාත්‍යාංශයක සේවය කරන රජයේ නිලධරයකු සම්බන්ධයෙන් යෙදෙන විට, අමාත්‍යාංශයේ ලේකම්වරයා නැතහොත් ඒ රජයේ නිලධරයා ලේකම්වරයා වන අවස්ථාවක, ඒ අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා ඉන් අදහස් වේ ;

(ඇ) එය උපලේඛනගත රජයේ නිලධරයකු සම්බන්ධයෙන් යෙදෙන විට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 112 වන ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද අධිකරණ සේවා කොමිෂන් සභාව ඉන් අදහස් වේ ;

(ඈ) එය වෙනත් යම් රජයේ නිලධරයකු සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ රජයේ නිලධරයා සේවය කරන්නේ යම් ප්‍රධාන විධායක නිලධරයකුගේ සාමාන්‍ය විධානය සහ පාලනය යටතේ ද ඒ ප්‍රධාන විධායක නිලධරයා ඉන් අදහස් වේ ;

(ඉ) එය රාජ්‍ය සංස්ථාවක, පළාත් පාලන ආයතනයක හෝ ඒ හා සමාන වෙනත් ආයතනයක නිලධරයකු සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ රාජ්‍ය සංස්ථාවේ, පළාත් පාලන ආයතනයේ හෝ ඒ හා සමාන වෙනත් ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා නැතහොත්, ඒ නිලධරයාම ඒ රාජ්‍ය සංස්ථාවේ, පළාත්පාලන ආයතනයේ හෝ ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා වන අවස්ථාවක, ඒ රාජ්‍ය සංස්ථාව, පළාත්පාලන ආයතනය හෝ ආයතනය ක්‍රියාත්මක වන්නේ යම් අමාත්‍යාංශයක් යටතේ ද, ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයා ඉන් අදහස් වේ ;

''මානව හිමිකම්'' යන්නෙන් සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය විසින් සහ ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය විසින් ප්‍රකාශ කොට පිළිගෙන ඇති අයිතිවාසිකමක් අදහස් වේ ;

''ආයතනය'' යන්නට, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක්, රාජ්‍ය සංස්ථාවක්, ව්‍යවස්ථාපිත මණ්ඩලයක් හෝ කොමිෂන් සභාවක්, පළාත් පාලන ආයතනයක්, ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතනයක් සහ ආණ්ඩුව විසින් වැඩි කොටස් සංඛ්‍යාවක් දරන සමාගමක් ද ඊට ඇතුළත් වේ ;

''පළාත් පාලන ආයතනය'' යන්නෙන්, යම් මහ නගර සභාවක්, නගර සභාවක්, හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට හා කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇතිකොට පිහිටුවන ලද කවර හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ ;

''රාජ්‍ය සංස්ථාව'' යන්නෙන්, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ හැර, වෙනත් යම්කිසි ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද, ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද, සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ.